᪥ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1972/40 - 2016 ජුනි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2016.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 3/කටා/ඉ.අත්/72.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමුව* : එල්ඩී/05/2010/පීසී/34.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දූනගහ පත්තුව සුළු කොට්ඨාසයේ උතුරු කදිරාන ගමේ පිහිටි ගම්පහ ජ්‍යේෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සහතික කරන ලද අංක මු. පි. ගම්. 3961 දරන පිඹුරේ කැබලි අංක 1 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0985ක් විශාල ඉඹුල්ගස්වාඩියවත්ත නමැති ඉඩම :

1. **කැබලි අංක 1**

ඉඩමේ නම: ඉඹුල්ගස්වාඩියවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, ස්ථිර ගොඩනැගිල්ලකින් කොටසක්, වැසිකිලියක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් කියන අය : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0985

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 අගෝස්තු මස 24 වැනි දින පෙ.ව. 9.30ට කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 අගෝස්තු මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී *ඉඩම/පරවශතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කේ. ජී. එච්. එච්. ආර්. කිරිඇල්ල,  
ප්‍රාදේශීය ලේකම්,  
කටාන.

2016 මැයි මස 26 වැනි දින,  
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 419

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/13/2013/CA/106.

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : HIK/DS/LND/04/01/09.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කර ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 67 බී පැරළිය දකුණ ග්‍රාම නිලධාරි වසමේ පැරළිය ගමේ පිහිටි ගාල්ල දිස්ත්‍රික් සර්වෙයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.ගා. 4113 හා 2016.03.29 දිනැති මූලික

පිඹුරේ පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.3079ක් වු පහත විස්තර කරන ඉඩම් කැබැල්ල (01 ):

**කැබලි අංක 01**

ඉඩමේ නම: නුගගහවත්ත, තොටබොඩවත්ත සහ කරාවේ වී අමුණ; හිමිකම : රජය; මුල් හිමිකම් කියන අය : සභාපති, මධ්‍යම සංස්කෘතික අරමුදල, අංක 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07; ප්‍රමාණය : හෙක්ටයාර් 1.3079

*මායිම් :*

*උතුරට* : කේ. දයානන්ද, ඒ. නියුදද සිල්වා සහ වී. ආර්. කරුණානායක හිමිකම් කියන නුගගහවත්ත, තොටබොඩවත්ත සහ කරාවේ වී අමුණ ඉඩම; *නැගෙනහිරට* : කේ. දයානන්ද සහ ඊ. වී. ආර්. කරුණානායක හිමිකම් කියන නුගගහවත්ත, තොටබොඩවත්ත සහ කරාවේ වී අමුණ ඉඩම; *දකුණට* : කාණුව සහ හිල්ඩා මුනින්දදාස සහ තවත් අය හිමිකම් කියන නුගගහවත්ත, තොටබඩෙවත්ත සහ කරාවේ වී අමුණ ඉඩම; *බටහිරට* : හිල්ඩා මුනින්දදාස සහ තවත් අය, කේ. දයානන්ද සහ ඒ. නියුද ද සිල්වා සහ හිමිකම් කියන නුගගහවත්ත, තොටබොඩවත්ත සහ කරාවේ වී අමුණ ඉඩම,

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 සැප්තැම්බර් මස 05 වැනි දින පෙ.ව. 10.00ට හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 අගෝස්තු මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/ පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

දමයන්ති පරණගම,
ප්‍රාදේශීය ලේකම්,
හික්කඩුව.

2016 අප්‍රේල් මස 29 වැනි දින,
හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 420

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ(460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ ශුද්ධි පත්‍රිකාව

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය - පැරණි අංකය* : මැදු/3/1/2/87.
නව අංකය : KDS/MDB/4/2/1/87.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 13/99/NH/129.

අංක 1657/29 හා 2010.06.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී *ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 7 වගන්තිය යටතේ දැන්වීමෙහි සඳහන් පිඹුරු අංක ග.පි. 467 හි පත්‍රය 2 හි කැබලි අංක 76 ප්‍රමාණය හෙක්ටයාර් 13.3887 සහ පිඹුරු අංක ග.පි. 468 හි පත්‍රය 8 හි කැබලි අංක 274 ප්‍රමාණය හෙක්ටයාර් 79.3857 ඉවත් විය යුතු අතර එම දැන්වීමේ අත්කර ගැනීමට යෝජිත ඉඩම් කැබලිවල ප්‍රමාණයෙන් පහත පරිදි විය යුතු ය:-

| *මූලික පිඹුරු අංක* | *කැබලි අංක* | *ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණය* |
|---|---|---|
| ග.පි. 467 හි පත්‍රය - 2 | 68 | හෙක්ටයාර් 0.0357 |
| ග.පි. 467 හි පත්‍රය - 2 | 69 | හෙක්ටයාර් 0.0221 |
| ග.පි. 467 හි පත්‍රය - 2 | 70 | හෙක්ටයාර් 0.0213 |
| ග.පි. 467 හි පත්‍රය - 2 | 71 | හෙක්ටයාර් 0.0169 |
| ග.පි. 467 හි පත්‍රය - 2 | 72 | හෙක්ටයාර් 0.0117 |
| ග.පි. 467 හි පත්‍රය - 2 | 73 | හෙක්ටයාර් 0.0099 |
| ග.පි. 467 හි පත්‍රය - 2 | 74 | හෙක්ටයාර් 0.0022 |
| ග.පි. 467 හි පත්‍රය - 2 | 75 | හෙක්ටයාර් 0.0662 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 262 | හෙක්ටයාර් 0.1603 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 263 | හෙක්ටයාර් 0.0999 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 264 | හෙක්ටයාර් 0.1285 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 265 | හෙක්ටයාර් 0.1181 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 266 | හෙක්ටයාර් 0.1102 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 267 | හෙක්ටයාර් 0.1209 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 268 | හෙක්ටයාර් 0.1207 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 269 | හෙක්ටයාර් 0.1020 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 270 | හෙක්ටයාර් 0.0850 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 271 | හෙක්ටයාර් 0.1939 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 272 | හෙක්ටයාර් 0.0357 |
| ග.පි. 468 හි පත්‍රය - 8 | 273 | හෙක්ටයාර් 0.0023 |

ජේ. එම්. ජේ. කේ. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2016 අප්‍රේල් මස 25 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

07 - 421

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.